**වසරක මෙහෙවර - රණවිරුවන් වෙනුවෙන් ඉටුකල යුතුකම් වෙනුවෙන් පසු විපරමක්**

1999 වසරේ එවකට පැවති රජයේ අරමුණක් අනුව පිහිටවන ලද "රණවිරු සේවා අධිකාරිය" මේ වනවිට දිවයින පුරා රණවිරුවන් වෙනුවෙන් සුවිශාල මෙහෙවරක යෙදීසිටී. මුලිකව මෙම අධිකාරිය පිහිටවූයේ "ත්‍රිවිධ හමුදාවන් සහ පොලිස් සේවයේ ක්‍රියාන්විත රාජකාරීන්හිදී රට වෙනුවෙන් දිවිපිදූ අතුරුදන් වූ ආබාධිත තත්වයට පත් රණවිරුවන් මෙන්ම දැනට සේවයේ නියුතු රණවිරුවන්ගේ සහ එම පවුල්වල සාමාජිකයන්ගේ මානසික සහ සාමාජීය වශයෙන් අභිමානවත් දැක්මක් ඇති පිරිසක් ලෙස ගොඩනැංවීමට සහ ඒ වෙනුවෙන්ම වූ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම වෙනුවෙනි.

වෙන්ව බැලු කල මෙම අධිකාරියේ මෙහෙවර වන්නේ "ශ්‍රී ලංකාවේ ඒකීය භාවය සුරක්ෂිත කරනු වස් සිය ජීවිත කැප කල සටනේදී අතුරුදහන්වූ සහ රණක්ෂයට පත් රණවිරුවන්ගේ සාමාජීය සහ මානසික තත්වය ස්ථාවරත්වයක් ඇති කිරීම සහ සේවයේ නියුතු රණවිරුවන්ගේ සහ එම පවුල්වල මානසික ප්‍රබෝධයක් ඇතිවන අයුරින් ක්‍රියා කිරීමයි"

ඒ අනුව පසුගිය දශක එකහමාරකට ආසන්න කාලසීමාව තුල රණවිරුවන් වෙනුවෙන් විවිධ වූ වැඩසටහන් මෙන්ම ව්‍යාපෘතීන් විශාල සංඛාවක් ඇති සාර්ථකව රණවිරුවන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල උන්නතිය සහ සුභ සාධනය වෙනුවෙන් ක්‍රියාවට නංවා ඇත. කෙසේ වෙතත් මෙම ලිපියේ අරමුණ වන්නේ ගෙවී යන 2011 වසරේ රණවිරුවන් වෙනුවෙන් රණවිරු සේවා අධිකරිය මගින් සිදුකරන ලද සේවය මෙන්ම ක්‍රියාවට නංවන ලද වැඩසටහන් සහ ව්‍යාපෘතීන් පිලිබඳ පසුවිපරමක් කිරීමයි.

අප මෙම ලිපිය ආරම්භයේ සඳහන් කල අරමුණු සාර්ථක කරගැනීම වෙනුවෙන් රණවිරු සේවා අධිකරිය සිය ව්‍යාපෘති සහ වැඩසටහන් ක්‍රියාත්මක කොට ඇත්තේ ප්‍රධාන අංශ හතරක් යටතේයි.

**01 කායික සහ මානසික සවිබල ගැන්වීම පිලිබඳ අංශය**

මේ යටතේ මනෝ සාමාජීය සහ ආබාධිත රණවිරු සුභසාධනය යනුවෙන් අංශ දෙකක් යටතේ ක්‍රියාත්මක වේ .

**02 සමාජීය සහ සංස්කෘතික අංශය**

මේ යටතේ සාමාජීය, ගම්මාන සහ සංස්කෘතික ලෙස අංශ තුනක් ක්‍රියාත්මක වේ.

**03 රණවිරු අභිමානය සහ ගෞරවය අංශය**

මේ යටතේ රණවිරු අනුස්මරණ, ඉඩම් සහ මාධ්‍ය යන තෙ අංශයන් මුලික කොට ගනිමින් ව්‍යාපෘති සහ වැඩසටහන් ක්‍රියාත්මක වේ.

**04 අධ්‍යාපන නිපුණතා සහ ආර්ථික සංවර්ධන අංශය**

මේ යටතේ නිපුණත සංවර්ධනය, නිවාස ණය, අධ්‍යාපන ශිෂ්‍යත්ව, මාපිය කැපකරු වැඩටහන්, නිවාස ආධාර වැඩසටහන් හා දත්ත සහ තොරතුරු අංශ ලෙස ව්‍යාපෘති සහ වැඩසටහන් ක්‍රියාත්මක වේ වශයෙනි.

2011 වසරේ මේ යටතේ රණවිරුවන් සවිබල ගැන්වීම වෙනුවෙන් ආබාධිත රණවිරුවන් සඳහා සිය ආබාධ සහිත තත්වයන් යටතේම තරමක් හෝ පහසුවෙන් සිය කටයුතු කරගෙන යාම වෙනුවෙන් සහ ස්වයං එමෙන්ම කායික මානසික සවිබල ගැන්වීම වෙනුවෙන් වෛද්‍ය සායන 2 ක් සහ මනෝ විද්‍යාත්මක සායන වැඩසටහන් සහ මනෝ උපදේශන සායන 02 ක් පුද්ගල කුශලතා සංවර්ධන වැඩසටහන්ක් සහ ඒ සඳහා වූ වෛද්‍ය ආධාර ලබාදීම් 12 ක් ද වෛද්‍ය සහන ණය 05 ක් (මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක වනුයේ රණවිරුවන් ගේ ඉල්ලීම මතයි.) ලබාදීම සිදුවී ඇත.
මෙහි සඳහන් කල අංශයන්ට වඩා වෙන්වෙන්ව ක්‍රියාත්මක කරනලද සුභසාධන වැඩසටහන් විශාල සංඛ්‍යාවක් ක්‍රියාත්මක කොට ඇත.පුහුණු වැඩසටහන් පහසුකම් අත්‍යවශ්‍ය විවිධ අපහසුතා යටතේ සිටින රණවිරුවන් ඉලක්ක කොට ක්‍රියාත්මක කරනලද වැඩසටහන් විශාල සංඛ්‍යාවක් ද මේ අතර වේ .

තවද සමාජීය සහ සංස්කෘතික අංශය යටතේ රණවිරුවන් වෙනුවෙන් නායකත්ව වැඩමුළු සහ ආධ්‍යාත්මික සාමාජීය වැඩසටහන් 04 ක් දිස්ත්‍රික් දැනුවත් කිරීමේ වැඩසටහන් 10 ක්, සාමාජිකත්වය රඳවා ගැනීම වෙනුවෙන් සංසද ක්‍රියාකාරිත්ව වැඩසටහන් සහ සංසද පොකුරු වැඩසටහන් 09 ක්, රණවිරු ගම්මාන සුභදතා වර්ධන වැඩසටහන් සහ ගෙවතු වගා වැඩසටහන් 01 ක් මෙන්ම රණවිරු ගම්මාන සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහනක් වශයෙන් මුළු දිවයිනම ආවරණය වන පරිදි ව්‍යාපෘති විශාල ප්‍රමාණයක් ක්‍රියාත්මක කොට ඇති අතර මෙහි සුවිශේෂීම

වැඩසටහන වන්නේ රණවිරුවන්ගේ දුවා දරුවන් වෙනුවන් සංවිධානය වූ "රණවිරු සුවඳ "ළමා සාහිත්‍ය උළෙලයි.

රණවිරු දූ දරුවන්ගේ පරිගණක දැනුම සහ අධ්‍යාපනික නිපුණතාවය වර්ධනය කිරීම වෙනුවෙන් රණවිරු සේවා අධිකාරිය මගින් මේ වසරේ නව පරිගණක මධ්‍යස්ථාන 04 ක් ආරම්භ කර ඇති අතර ඒ වෙනුවෙන් පරිගණක උපදේශකයන් 45 දෙනෙක් සේවයට යොදවා ඇත.තවද රණවිරු දූ දරුවන් වෙනුවෙන් අර්ධ ශිෂ්‍යත්ව 09 ක් පිරිනමා ඇති අතර සෞන්දර්යය විෂයය කටයුතු දියුණු කිරම වෙනුවෙන් (නැටුම් සහ සංගීත) උපදේශකයින් 25 දෙනෙක් බඳවාගෙන ඇති අතර ඒ වෙනුවෙන් අවශ්‍ය දීමන ගෙවනු ලබන්නේද රණවිරුසේවා අධිකාරිය මගිනි. රණවිරු දූ දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සාර්ථක කිරීම වෙනුවෙන් විවිධ වූ ශිෂ්‍යත්ව වැඩසටහන් ක්‍රියාත්මක කොට ඇති අතර මේ වසරේ අවස්ථා 13 කදී රණවිරු දූදරු ඉතුරුම් ආයෝජන ශිෂ්‍යත්ව 243 ක් පිරිනමා ඇති අතර අධ්‍යාපන ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ අ.පො.ස සා/පෙළ සහ උසස පෙළ සමත් දූ දරුවන් වෙනුවෙන් ශිෂ්‍යත්ව 75 ක් පිරිනමා ඇත. තවද මාපිය කැපකරු වැඩසටහන යටතේ මේ වසරේ රණවිරු දූ දරුවන් 5725 දෙනෙකු වෙනුවෙන් ශිෂ්‍යත්ව පිරිනමා ඇත ඒ අනුව ඒ සෑම දරුවෙක් වෙනුවෙන්ම සිය අධ්‍යාපන කටයුතු නිමවන තෙක් මසකට රුපියල් 600 ක මුදලක් සිය කටයුතු වෙනුවෙන් ලැබේ.

තවද විශේෂ පහසුකම් අවශ්‍ය රණවිරු දූ දරුවන්ගේ ප්‍රතිකාර කටයුතු වෙනුවෙන් වෛද්‍ය ආධාර 16 ක් ද ගෙවීයන වසරේ පිරිනම ඇත.

රණක්ෂයට පත් රණවිරුවන්ගේ මෙන්ම ඔවුන්ගේ පවුල්වල අයවලුන් වෙනුවෙන් ශක්තිමත් ආර්ථිකයක් ගොඩනැගීම වෙනුවෙන් ස්වයං රැකියා වැඩමුළු පවත්වා ස්වයං රැකියා ණය මෙන්ම ස්වයං රැකියා ආධාර 24 පිරිනමා ඇත. එමෙන්ම එම අයවලුන්ගේ කටයුතු නිරීක්ෂණය කිරීම වෙනුවෙන් පසුවිපරම් කමිටු සහ නිලධාරින්ද යොදවා ඇත.
රණවිරුවන් ගේ වියපත් මා පියන් වෙනුවෙන් ද සුභසාධන සේවා රැසක් සිදුකොට ඇති අතර මාපිය සුරැකුම් වැඩසටහන යටතේ ඔවුන් වෙනුවෙන් නව ගිණුම් 92 ක් අරඹා ඇති අතර පැරණි ගිණුම් 1202 ක් සඳහා මුදල් තැන්පත් කොට ඇති අතර රණවිරු පවුල් 1191 දෙනෙකු වෙනුවෙන් හදිසි ආපදා ආධාර ලබාදීම මේ වසරේ සිදුකොට ඇති අතර රණවිරුවන් වෙනුවෙන් හැදුනුම්පත් 681 සකසා ඇත.

ඉහත සඳහන් ව්‍යාපෘති සහ වැඩසටහන් වලට අමතරව පහත සඳහන් වැඩසටහන්ද රණවිරු සේවා අධිකාරියේ අරමුණු සාර්ථක කරගැනීම සහ රණවිරුවන්ගේ සුභසාධනය වෙනුවෙන් ගෙවී යන 2011 වසරේ ක්‍රියාවට නංවා ඇත.

- ආබාධිත රණවිරුවන් සඳහා සහන ණය පදනම යටතේ ත්‍රීරෝද රථ 180 ක් නොවැම්බර් 19 වන දින බෙදාදීම.
- නිවාස ආධාර වැඩසටහන යටතේ රණවිරු පවුල් සඳහා නිවාස ආධාර 142 ක් ලබාදීම.
- පහ වසර ශිෂ්‍යත්වයෙන් සමත් රණවිරු දරුවන් සඳහා රුः 11 ලක්ෂයක් වටිනා ශිෂ්‍යත්ව පිරිනැමීම සහ ප්‍රථම ස්ථානය ලබාගත් දියණියට රු. 30,000.00 ක් සහ පහ වසර ශිෂ්‍යත්වය සමත් අනෙකුත් රණවිරු දරුවන්ට රු. 15,000.00 ක් බැගින් පිරිනැමීම.
- ආබාධිත රණවිරුවන් සඳහා ලබාදෙන නාන කාමර ආධාර පළමු වාරික 145 ක් සහ දෙවන වාරික 175 ක් පිරිනැමීම.
- රණවිරු ගම්මානවල අධිකාරියේ මූල්‍ය දායකත්වය ඇතිව ක්‍රියාත්මක කරන ඉංග්‍රීසි භාෂාව උගන්වන ගුරුවරුන් පුහුණු කිරීම සඳහා දින දෙකක නේවාසික වැඩමුළුවක් කොළඹදී පැවැත්වීම.
- රණවිරු පරිගණක මධ්‍යස්ථානවල අධිකාරියේ මූල්‍ය දායකත්වය ඇතිව ක්‍රියාත්මක කරන පරිගණක පාඨමාලා උගන්වන ගුරුවරුන් පුහුණු කිරීම සඳහා දින දෙකක නේවාසික වැඩමුළුවක් මොරටුව විශ්වවිද්‍යාලයේදී පැවැත්වීම.
- නොවැම්බර් මස අවසාන වන විට ස්වයංරැකියා ආධාර 40 ක් ලබාදීම.
- නොවැම්බර් මස අවසාන වන විට නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය යටතේ අර්ධ ශිෂ්‍යත්ව 24 ක් පිරිනැමීම.

මෙම කටයුතු කෙනකුට සුළුවෙන් හෝ පටුකොට හෝ ලඝු කොට තැකිය නොහැක. එම කිසිදු කටයුත්තක ලාභ ඉපයීමේ අරමුණක් නොමැත. සියල්ල සිදුකරනුයේ මෙරට වසර තිහක නොවිසේනම් දශක තුනකට අධික කාලයක් පුර පවත ත්‍රස්තවාදය අවසන් කොට සැමට නිදහසේ හුස්ම ගැනීමට නිදහසේ ජීවත් වීමට මග සැදීම වෙනුවෙන් සිය ජීවිත කැපකළ යුධ බිමේදී අතුරුදන් වූ සහ රණක්ෂයට පත් වීරෝදාර පිරිසකගේ සහ ඔවුන්ගේ යැපෙන්නන් ගේ යහපත වෙනුවෙනි. මන්ද

**"ඔවුන් සියල්ලන්ම ඔවුන්ගේ යහපත් වූ අද දවස අප සැමගේ යහපත් වූ හෙට දිනය වෙනුවෙන් කිසිඳු ප්‍රතිලාභයක් බලාපොරොත්තුවකින් තොරව කැපකළ නිසාවනි"**